# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

## 2018 අංක 11 දරන අපරාධ නඩු විධාන සංග්‍රහය (සංශෝධන) පනත

---

**[සහතිකය සටහන් කළේ 2018 මැයි මස 21 වන දින]**

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

2018 මැයි මස 25 වන දින **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ** II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැකි ය.

**මිළ :** රු. 8.00 යි. **තැපැල් ගාස්තුව :** රු. 10.00 යි.

මෙම පනත www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

## 2018 අංක 11 දරන අපරාධ නඩු විධාන සංග්‍රහය (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 2018 මැයි මස 21 වන දින]

එල්. ඩී.—ඕ. 42/2016

**1979 අංක 15 දරන අපරාධ නඩු විධාන සංග්‍රහය පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:—

ලුහුඬු නාමය.

**1.** මේ පනත 2018 අංක 11 දරන අපරාධ නඩු විධාන සංග්‍රහය (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

1979 අංක 15 දරන පනතට 122අ අලුත් වගන්තිය ඇතුළත් කිරීම.

**2.** 1979 අංක 15 දරන අපරාධ නඩු විධාන සංග්‍රහය පනතේ 122 වන වගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් වගන්තිය මෙයින් ඇතුළත් කරනු ලබන අතර, එය එම පනතේ 122අ වන වගන්තිය ලෙස බලාත්මක විය යුතු ය:—

"වයස අවුරුදු දොළහක හෝ ඊට වැඩි, සහ වයස අවුරුදු දාහතරට අඩු ළමයකු විසින් සිදු කරන ලදැයි කියනු ලබන වරදක් සම්බන්ධයෙන් වෛද්‍ය පරීක්ෂණය.

122අ. (1) වයස අවුරුදු දොළහක හෝ ඊට වැඩි වයස අවුරුදු දාහතරට අඩු ළමයකු විසින් සිදු කරන ලදැයි කියනු ලබන වරදක් විමර්ශනය කරන පොලිස් ස්ථානය භාර නිලධරයකු විසින්-

(අ) එම ළමයා විසින් කරන ලදැයි කියනු ලබන වරදේ ස්වභාවය සහ එහි ප්‍රතිඵල සැලකිල්ලට ගනිමින්, එම ළමයාගේ වගකීමේ ප්‍රමාණය කොපමණ ද යන්න; සහ

(ආ) එම ළමයාට යම් චිකිත්සක ප්‍රතිකාර අවශ්‍ය වන්නේ ද යන්න,

ඒ කාරණය පිළිබඳ අධිකරණ බලය ඇති මහෙස්ත්‍රාත්වරයාට තීරණය කිරීමට හැකි කරවන්නා වූ, ප්‍රමාණවත් පැසුණු බුද්ධියක් එම ළමයා ලබා තිබේ ද යන්න පිළිබඳ වූ වාර්තාවක් ලබා ගැනීම සඳහා, එම ළමයාගේ මව, පියා හෝ භාරකරුගේ කැමැත්ත ඇතිව, එම ළමයා (2) වන උපවගන්තියේ සඳහන් විශේෂඥයන්ගෙන් සමන්විත බහු විෂය කණ්ඩායමක් මගින් පරීක්ෂා කරවා ගැනීමට කටයුතු සැලැස්විය යුතු ය.

2—PL 010733—2,877 (2018/04)

(2) (1) වන උපවගන්තියේ සඳහන් කර ඇති බහු විෂය කණ්ඩායමට-

(අ) අදාළ දිස්ත්‍රික්කයේ අධිකරණ වෛද්‍ය නිලධරයා;

(ආ) ළමා හෝ නව යොවුන්විය පිළිබඳ මනෝ වෛද්‍යවරයකු; සහ

(ඇ) මනෝ විද්‍යාඥයකු,

ඇතුළත් විය යුතු ය.

(3) එම ළමයාගේ මව, පියා හෝ භාරකරු, ළමයා එසේ පරීක්ෂා කරනු ලැබීමට කැමැත්ත නොදෙන අවස්ථාවක දී, එම බහු විෂය කණ්ඩායමට එම ළමයා පරීක්ෂා කිරීමට බලය ලබා දෙන ආඥාවක්, ඒ කාරණය පිළිබඳ අධිකරණ බලය ඇති මහෙස්ත්‍රාත්වරයාගෙන් ලබා ගැනීමට පොලිස් ස්ථානය භාර නිලධරයා විසින් ඉල්ලීමක් කරනු ලැබිය යුතු ය.

(4) අදාළ දිස්ත්‍රික්කයේ අධිකරණ වෛද්‍ය නිලධරයා නොමැති යම් අවස්ථාවක දී, වරද විමර්ශනය කරන පොලිස් ස්ථානය භාර නිලධරයා විසින්, (1) වන උපවගන්තියේ සඳහන් කර ඇති වාර්තාව ලබා ගැනීම සඳහා වෙනත් යම් දිස්ත්‍රික්කයක අධිකරණ වෛද්‍ය නිලධරයකුගෙන් සහාය ලබා ගත යුතු ය.

(5) එම බහු විෂය කණ්ඩායම විසින් තම වාර්තාව පොලිස් ස්ථානය භාර නිලධරයාට ඉදිරිපත් කළ යුතු අතර, දණ්ඩ නීති සංග්‍රහයේ 76 වන වගන්තියේ විධිවිධාන සැලකිල්ලට ගෙන, (1) වන උපවගන්තියේ සඳහන් පරිදි මහෙස්ත්‍රාත්වරයාගේ මතය ගොඩනගා ගැනීමට සහ තීරණය ගැනීමට ඔහුට සහායවීම පිණිස පොලිස් ස්ථානය භාර නිලධරයා විසින් එම වාර්තාව මහෙස්ත්‍රාත්වරයා වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

(6) (1) වන උපවගන්තියේ සඳහන් කර ඇති ළමයා, ළමයින් පිළිබඳ මනෝ වෛද්‍යවරයකු සහ මනෝ විද්‍යාඥයකුගේ අධීක්ෂණය සහ ඇගයුම යටතේ, නියමිත ආකාරයට පුනරුත්ථාපනය කරනු ලැබිය යුතු ය.”.

3. මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

පාර්ලිමේන්තුවේ සිංහල පනත්, අංක 118, දෙස්තර ඩැනිස්ටර් ද සිල්වා මාවත, කොළඹ 08,
රජයේ මුද්‍රණාලයේ පිහිටි "ප්‍රකාශන පියස" හි දී මිල දී ගත හැකි ය.